## මූලපණ්ණාසක (මුල් සූත්‍ර පණස)

# 6. ආකඞ්ඛෙය්‍ය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනාථ පිණ්ඩික සිටුහු විසින් කරවනලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ,මහණෙනි,, කියා භික්ෂූන්ට කථාකළහ. ,ස්වාමීන් වහන්සැ,යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

2. ,මහණෙනි, සීලයෙන් යුක්තව වාසය කරවු. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තව වාසය කරවු. ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව වාසය කරවු. ඉතා සුලුවූද වරදට භයවන ගති ඇතිව වාසය කරවු. ශික්ෂාපද සමාදන්ව ඊට අනුව හික්මෙව්.

මහණෙනි, මහණ තෙම සමාන බඹසර ඇත්තවුන්ට ප්‍රිය වූවෙක් මනාපවූවෙක් ගරුකළ යුත්තෙක් සැලකිය යුත්තෙක් වන්නෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගන්නෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සුන්‍යාගාර වඩන්නෙකු (පාලු විවේක ස්ථානයක හිඳ භාවනා කරන්නා ශුන්‍යාගාර වඩන්නා යයි කියනු ලැබේ) වියයුතුය.

3. ,මහණෙනි, මහණ තෙම සිවුරු, ආහාර, ගිලන්පස, බෙහෙත්, පිරිකර, ලබන්නෙක් වෙමියි ඉදින් කැමති වන්නේ නම්, ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ හිත සමථයෙහි පිහිටුවා ගන්නෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

මහණෙනි, මහණ තෙම යම් කෙනෙකුන්ගේ සිවුරු, ආහාර, සෙනසුන්, ගිලන්පස, බෙහෙත්, පිරිකර මම වළඳම් නම් ඔවුන්ගේ දානමය පින්කම් මහත්ඵල වේවායි, මහත් ආනිසංස වේවායි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගන්නෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

4. ,මහණෙනි, මහණ තෙම පරලොව ගියාවූ මාගේ යම් නෑ සහ ලේ නෑ කෙනෙක් වෙත්ද ඔවුහු සතුටු සිතින් මා සිහිකරන්නාහ. ඔවුන්ගේ ඒ සිහි කිරීම මහත්ඵල වේවායි, මහානිසංස වේවායි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගන්නෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

**5.** ,මහණෙනි, මහණ තෙම කුසල ධර්මයන්හි නොඇලී මද(කම්සැපෙහි) ඇල්මද ඉවසන්නෙක් (මැඩපවත්වන්නෙක්) වන්නෙමි. ඒ කුශල ධර්මයන්හි නො ඇලීමද යම්සේ මා නොමඩින්නේද එසේ උපන් කුසල ධර්මයන්හි නො ඇල්ම මැඩ මැඩ වාසය කරමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

**6.** ,මහණෙනි, මහණ තෙම භයානක අරමුණු ඉවසන්නෙමි. සිත තැතිගැන්ම හා භයානක අරමුණු මා මැඩනොපවත්නේද එසේ උපන් භයජනක අරමුණු මැඩ මැඩ වාසය කරමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

**7.** ,මහණෙනි, මහණ තෙම පිරිසිදු සිතෙහි හට ගත්තාවූ මේ ආත්මයෙහි සැප වාස ඇත්තාවූ රූපාවචර ධ්‍යාන හතර කැමතිසේ ලබන්නෙක්, පහසුවෙන් ලබන්නෙක්, අමාරුවක් නැතිව ලබන්නෙක් වන්නෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

**8.** ,මහණෙනි, මහණ තෙම සංසිඳුනාවූ විරුධධර්මයන් කෙරෙන් මිදුනා වූ රූපාවචර ධ්‍යානය ඉක්ම සිටි හෙයින් රූප රහිත වූ යම් ඒ අරූප ධ්‍යානයෝ වෙත්ද ඔවුන් නාම කයින් ස්පර්ශකොට වාසය කරන්නෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

**9.** ,මහණෙනි, මහණතෙම සංයොජන (කෙලෙස් බැමි) තුන නැති කිරීමෙන් දුගතියක නොහෙලන ස්වභාව ඇති, නිවන් මගට නියමවූ, සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් කෙනෙක් වෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු , විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

**10.** ,මහණෙනි, මහණතෙම තුන් සංයොජනයන් නැති කිරීමෙන් රාග ‍ද්වෙෂ මොහයන් තුනීකිරීමෙන් සකෘදාගාමී වන්නෙමි, එක් වරක්ම මේ මනුෂ්‍ය ලොකයට අවුත් දුක් කෙළවර කරන්නෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

,මහණෙනි, මහණතෙම ඔරම්භාගිය (කාමලොකය සේවනය කරන්නාවූ සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස කාමරාග ව්‍යාපාද යන) සංයොජන පස නැතිකිරීමෙන් ඔපපාතිකවී ඒ බ්‍රහ්ම

ලොකයෙන් පෙරළා නොඑන ස්වභාව ඇතිව එහිදීම පිරිනිවන් පාන්නෙක් වෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සුන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

11. ,මහණෙනි, මහණතෙමේ නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට දක්වමි. එකෙක්ව බොහෝසේ වෙමි. බොහෝසේව එකෙක් වෙමි . ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය විනිවිද, පවුර විනිවිද, පර්වතය විනිවිද, නොහැපෙමින් යමි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කරමි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබිඳ ගමන් කරමි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්‍යංකයෙන් හිඳ ගෙනම යමි. මේ මහත් ඍධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගාමි, පිරිමදිමි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වමියි, ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සුන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

12. ,මහණෙනි, මහණ තෙම පිරිසිදුවූ, මිනිස් කණ ඉක්ම පැවැත්තාවූ දිව කණින් දිව්‍යමය වූද මනුෂ්‍යමය වූද දුර වූද සමීපයෙහිවූද ශබ්ද අසන්නෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සුන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

13. ,මහණෙනි, මහණ තෙම අන්‍ය සත්වයින්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තම සිතින් පිරිසිඳ දන්නෙමි. රාග සහිත සිත රාග සහිත සිත යැයි දන්නෙමි. රාගය පහවූ සිත රාගයෙන් පහවූ සිතයයි දනිමි. ෙවෂ සහිත සිත ෙවෂ සහිත සිත යැයි දන්නෙමි. ෙවෂය පහවූ සිත ෙවෂයෙන් තොරවූ සිතයයි දනිමි.  මොහ සහිත සිත මොහ සහිත සිත යැයි දන්නෙමි. මොහය පහවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනිමි. හැකුලුණු සිත හැකුලුණු සිත යයි දනිමි . විසිරුණු සිත විසිරුණු සිතයයි දනිමි. මහත්බවට ගිය සිත මහත්බවට ගිය සිතයයි දනිමි. මහත්බවට නොගිය සිත මහත්බවට නොගිය සිතයයි දනිමි. කාම සහිත සිත කාම සහිත සිතයයි දනිමි. ලෞකිකහින් අතරින් උසස්ම සිත අනුත්තර සිතයයි දනිමි. සමාධිගතවූ සිත සමාධිගතවූ සිතයයි දනිමි. සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනිමි. (ක්ලේශයෙන්) මිදුනු සිත මිදුනු සිත යයි දනිමි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනිමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සුන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

14. ,මහණෙනි, මහණ තෙම නන්වැදෑරුම්වූ පෙර විසූ තැන් සිහි කරන්නෙමි. හේකෙසේදයත්, එක්ජාතියක්ද, ජාතිදෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් ජාති ලක්ෂගණන්ද අසවල් තැන වූයෙමි. මෙබඳු නම් ඇත්තේ, මෙබඳු ගොත්‍ර ඇත්තේ, මෙබඳු වර්ණ ඇත්තේ, මෙබඳු ආහාර ඇත්තේ, මෙබඳු සැප දුක් විඳින්නේ, මෙබඳු

ආයුෂ කෙළවරකොට ඇත්තේ වීමි. ඒ මම එයින් චුතවූයෙමි. අසුවල් තැන උපනිමි. එහිද මෙබඳු නම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු සැප දුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ කෙළවරකොට ඇත්තේ වීමි. ඒ මම එයින් චුතවූයෙමි මෙහි උපන්නෙමි. මෙසේ ආකාර දැක්වීම් සහිතව නානාප්‍රකාරවූ පෙර විසූ ආත්ම සිහි කරමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

15. ,මහණෙනි, මහණ තෙම .පිරිසිදුවූ මිනිසත්බව ඉක්මෙව්වාවූ දිව ඇසින් බලන්නෙම්, චුතවන්නාවූද, උපදින්නාවූද, හීනවූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද, කම්වූ පරිදි මිය පරලොව යන්නාවූද සත්‍වයන් දැනගන්නෙමි, මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු, වාග් දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහු, ආර්‍ය්‍යයන්ට දොස් කියන්නාහු, මිසදිටු වූවාහු, මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවාහු මරණින් මතු සැපයෙන පහවූ හෙයින් අපාය නම්වූ දුකට පැමිණෙන හෙයින් දුග්ගති නම්වූ විවසව (හිස යටිකුරුව) වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහුය. මේ පින්වත් සත්වයෝ කයින් කරන සුචරිතයෙන් යුක්තවූවාහු වචනයෙන් කරන සුචරිතයෙන් යුක්තවූවාහු හිතින් කරන සුචරිතයෙන් යුක්තවූවාහු ආර්‍ය්‍යයන්ට දොස්නොකියන්නාහු සම්‍යක් දෘෂ්ටි ඇත්තාහු සම්‍යක් දෘෂ්ටි සමාදන් වූවාහු ශරීර භෙදයෙන්, මරණින් මතු සුගති නම්වූ ස්වර්ග ලොකයෙහි උපන්නාහුයයි මෙසේ මිනිස් ඇස ඉක්මවූ , පිරිසිදු දිවැසින්, චුතවන්නාවූද, උපදින්නාවූද, හීනවූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත්ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද කම්වූ පරිදි පරලොව යන සත්‍වයන් දැන ගන්නෙමි.යි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය. මහණෙනි, මහණතෙම ආශ්‍රව (කෙලෙස්) නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ චිත්ත විමුක්තියත් ප්‍රඥා විමුක්තියත් මේ ජාතියේදීම විසිතුරු නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරන්නෙමියි ඉදින් කැමති වන්නේ නම් ශීලයම මැනවින් සම්පූර්ණ කරන්නෙකු විය යුතුය. තමාගේ සිත සමථයෙහි පිහිටුවා ගත්තෙකු, බැහැර නොකළ ධ්‍යාන ඇත්තෙකු, විදර්ශනාවෙන් යුක්ත වූවෙකු, සූන්‍යාගාර වඩන්නෙකු විය යුතුය.

මහණෙනි, ශීලයෙන් යුක්තව වාසය කරව්, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තව වාසය කරවූ, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව වාසය කරවූ, ඉතා සුලුවූද වරදට භයවන ගතියෙන් වාසය කරවූ, ශික්ෂාපද සමාදන්ව ඊට අනුව හික්මෙව් යැයි යමක් (මුලදී) කියන ලදද එය මේ සඳහා කියනලදී.,

භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය ප්‍රකාශ කළහ. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ.

**හයවෙනිවූ ආකඞ්ඛෙය්‍ය සූත්‍රය නිමි.**